විගණකාධිපතිවරයාගේ ත්‍රෛවාර්ෂික වාර්තාව

2021-2023

ස්වාධීන කොමිෂන් සභා

පටුන

			පිටු අංක.
1.	විධායක සාරාංශය		2
2.	මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය		3
3.	ස්වාධීන කොමිෂන් සභා වල නිරීක්ෂණ		
	3.1	මැතිවරණ කොමිෂන් සභාව	5
	3.2	සීමා නිර්ණය කොමිෂන් සභාව	7
	3.3	රාජ්‍ය සේවා කොමිෂන් සභාව	9
	3.4	පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය	12
	3.5	ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව	14
	3.6	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව	21
	3.7	තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව	26
	3.8	අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය	28
	3.9	ජාතික පොලිස් කොමිෂන් සභාව	39

1. විධායක සාරාංශය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද පහත සඳහන් ස්වාධීන කොමිෂන් සභා 09 ට අදාළව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන මෙම වාර්තාව මගින් 2021, 2022 හා 2023 වර්ෂයන්ට අදාළව නිකුත් කර ඇති විගණන වාර්තාවල මෙම වාර්තාවේ දින වන විටත් විසඳී නොමැති වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුලත් වේ.

තවද මෙහි සඳහන් එක් එක් කොමිෂන් සභාවලට අදාළව 2021,2022 හා 2023 වර්ෂයන්ට අදාළව කොමිෂන් සභාවල පැවති මූලු වත්කම්, මුළු වගකීම් හා ස්කන්ධයන්ද එසේම එක් එක් කොමිෂන් සභා සම්බන්ධයෙන් ලබාදී ඇති විගණන මතයන්ද මෙම වාර්තාව මගින් දක්වා ඇත.

2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය

ස්වාධීන කොමිෂන් සභා විසින් වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ. ආයතනවල ක්‍රියාකාරිත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් මූල්‍ය ප්‍රකාශනවලින් පිළිබිඹු කරන්නේද යන බවට ස්වාධීන සහතිකයක් විගණකාධිපති විසින් ලබාදෙනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මගින් මෙම සහතිකය ලබාදෙනු ලැබේ. ස්වාධීන කොමිෂන් සභාවන්හි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවලින් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන්නේද හෝ නොවන්නේද යන්න සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට හෝ දැනට ජාත්‍යන්තර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූල වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින්ට එම මූල්‍ය ප්‍රකාශන අනුකූල වන්නේද හෝ නොවන්නේද යන්න පිළිබඳ විගණකාධිපතිවරයාගේ නිගමනය විගණන මතයෙන් ප්‍රකාශ කෙරේ.

මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් හෝ නොඑකඟතාවයන් හා විෂය පථය සීමාවීම් හා කළමණාකරණය හා විගණනය අතර මතුවන නොඑකඟතාවයන් සලකාබැලීමෙන් අනතුරුව සිව් ආකාරයක මතයන් ප්‍රකාශයට පත්කරනු ලබයි. ඒවා නම්.

තත්ත්වාගණනය නොකළ මතය

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් හෝ අනුකූල නොවීම වාර්තා වී නොමැති විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

තත්ත්වාගණනය කළ මතය

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන හෝ නොගැලපීම් වාර්තා කර ඇති නමුත් ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වලට පැතිරී නොමැති විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

අහිතකර මතය

මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කර ඇති ප්‍රමාණාත්මක / සාවද්‍ය ප්‍රකාශයන් මූල්‍ය ප්‍රකාශන වලට ව්‍යාප්ත වී ඇති විට, අහිතකර විගණන මතය ප්‍රකාශ කෙරේ.

මතය ව්‍යාවනය කිරීම

විෂය පථය සීමා වීම හේතුවෙන් විගණකට විගණන මතය සඳහා ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි වීම හා විගණක විසින් මූල්‍ය ප්‍රකාශන වල හෙළි නොවූ සාවද්‍ය ප්‍රකාශ තිබිය හැකි යැයි තීරණය කරන විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

ස්වාධීන කොමිෂන් සභා වල මතය පිළිබඳ විස්තර

2021, 2022 සහ 2023 වසර සඳහා ස්වාධීන කොමිෂන් සභා 09කට අදාළව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නිකුත් කරන ලද විගණන මතයන් පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

	2021	2022	2023
තත්ත්වාගණනය නොකල	04	04	04
තත්ත්වාගණනය කල	05	05	05
අහිතකර	-	-	-
වියාචනය	-	-	-
මතය තවමත් තීරණය කර නොමැති ගණන	-	-	-
මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැති ගණන	-	-	-

	සමාගම් නාමය	2021	2022	2023
1.	මැතිවරණ කොමිෂන් සභාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
2.	සීමා නිර්ණය කොමිෂන් සභාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
3.	රාජ්‍ය සේවා කොමිෂන් සභාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ
4.	පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
5.	ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ
6.	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
7.	තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
8.	අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
9.	ජාතික පොලිස් කොමිෂන් සභාව	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ

3. ස්වාධීන කොමිෂන් සභා වල නිරීක්ෂණ

3.1 මැතිවරණ කොමිෂන් සභාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	මතය
	රු.	රු.	රු.	
2021	2,166,890,635	2,166,890,635	2,164,126,112	තත්ත්වාගණනය කළ
2022	2,302,705,969	2,302,705,969	2,301,513,323	තත්ත්වාගණනය කළ
2023	2,511,626,383	2,511,626,383	2,347,557,550	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	පසුගිය මැතිවරණ කිහිපයක් සඳහා නිසි සැලසුමකින් තොරව මිලදීගෙන තිබූ වටිනාකම රු.12,848,164 ක්වූ මුද්‍රණය සඳහා යොදා ගන්නා භාණ්ඩ අයිතම 4 ක් භාවිතා කිරීමකින් තොරව ගබඩාවේ නිශ්ක්‍රීයව පැවතුණි.	2022	මුදල් රෙගුලාසි 104 (1) ප්‍රකාරව කටයුතු කර වගකිව යුත්තන් නිශ්චය කිරීම කඩිනමින් කළ යුතු වීම.	මුදල් රෙගුලාසි 104(1) ප්‍රකාරව වගකිවයුත්තන් නිශ්චය කරගැනීම සඳහා කමිටුවක් පත්කිරීම.	කමිටු වාර්තාව මේ වන විට ඉදිරිපත් කර ඇති අතර නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.
(ආ)	2020 වර්ෂයේ කැබ් රථයකට සිදුවූ රු.2,075,845 ක්වූ අලාභය සම්බන්ධයෙන් 2022 මාර්තු 21 දින වන විටත් කටයුතු කර නොතිබුණි.	2021	වාහනවලට සිදුවූ අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	පාඩු හා හානි සම්බන්ධ විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.	විධිමත් විනය පරීක්ෂණය අවසන් කර විනය නියෝග ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත
(ඇ)	ඉකුත් වර්ෂයේදී සහ සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් පිරිවැය රු.6,717,017ක් හා	2021 2022 2023	යන්ත්‍ර හා උපකරණ අපහරණය කළ වත්කම්	අපහරණය කරන ලද වත්කම්වල කේතාංක හා වටිනාකම් CIGAS දත්ත	අදාළ ගැලපීම් අවසන් කළ වහාම ගිණුම් නිවැරදි කිරීමට කටයුතු

	රු.1,380,261 ක්වූ යන්ත්‍ර හා උපකරණ අපහරණය කර තිබුණද එම වත්කම් හඳුනාගෙන අදාල මූල්‍ය නොවන වත්කම් ගිණුම්වලින් ඉවත්කර නොතිබීමෙන් එම වටිනාකමින් මූල්‍ය නොවන වත්කම් ශේෂය වැඩියෙන් දැක්විණි. එසේම ඉකුත් වර්ෂයට පෙරද මෙසේ යන්ත්‍ර හා උපකරණ අපහරණය කර තිබුණද එම වටිනාකම්ද මූල්‍ය නොවන වත්කම් ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.		හඳුනාගෙන අදාල වටිනාකම මූල්‍ය නොවන වත්කම් ශේෂයෙන් ඉවත් කර නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම.	පද්ධතියේ කේතාංක හා වටිනාකම් සමඟ නොගැලපෙන බැවින් එය නිවැරදි කිරීම සඳහා කටයුතු කරමින් ඇත.	කරන බව සඳහන් කර ඇත.
(ඇ)	චක්‍රලේඛ ප්‍රකාරව වෙන් කල වාහන වලට හිමි ඉන්ධන සීමාව ඉක්මවා 2023 වර්ෂයේ වෙන් කළ වාහන 03 ක් සඳහා ඉන්ධන ලීටර් 1238.5 ක් ලබාදී තිබුණි.	2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වේ.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් දී ඇත.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඇත.

3.2 සීමා නිර්ණය කොමිෂන් සභාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	මතය
	රු.	රු.	රු.	
2021	3,434,683	3,434,683	3,434,683	තත්ත්වාගණනය කළ
2022	3,483,515	3,483,515	3,483,515	තත්ත්වාගණනය නොකළ
2023	3,673,026	3,673,026	3,673,026	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව මහජනයාගේ අවශ්‍යතාවයන්, ආයතනය පිළිබඳ චෝදනා හෝ ප්‍රශංසා පළකිරීමට තම නිල වෙබ් අඩවිය මගින් පහසුකම් සලසා තිබිය යුතු වුවත් කොමිෂන් සභාව විසින් වෙබ් අඩවියක් පවත්වා නොතිබුණි.	2023	නිල වෙබ් අඩවියක් පවත්වා ගත යුතු වේ.	වෙබ් අඩවියක පලකිරිමට තරම් අන්තර්ගතයක් හෝ නිශ්චිත කාර්ය භාරයක් නොමැති බැවින් නිල වෙබ් අඩවියක් සකස් කිරීම සිදුකර නැත.	නිල වෙබ් අඩවියක් සකස් කිරීමට අපේක්ෂා කරයි.
(ආ)	කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 15 ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 08 ක් වූ හෙයින් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 07 ක් පැවතුණි. ජ්‍යෙෂ්ඨ මට්ටමේ	2021 2022 2023	අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ.	නිරීක්ෂණය හා එකඟ වී ඇත.	මේ වන තෙක් එම පුරප්පාඩු පිරවීම සිදු කර නැත.

ලේකම් තනතුර හා ගණකාධිකාරී තනතුර සඳහා 2016 වර්ෂයේ සිට ස්ථිර නිලධාරීන් පත් කර නොතිබුණු අතර ඒ සඳහා වැඩබැලීමේ පදනම මත නිලධාරීන් අනුයුක්ත කර තිබුණි.

3.3 රාජ්‍ය සේවා කොමිෂන් සභාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	මතය
	රු.	රු.	රු.	
2021	856 880 407	856 880 407	856 825 716	තත්ත්වාගණනය කළ
2022	843 474 981	843 474 981	843 373 000	තත්ත්වාගණනය කළ
2023	904 240 563	904 240 563	904 184 961	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	කොමිෂන් සභාවේ විනය පාලනයට යටත් නිලධාරීන්ගේ විනය සම්බන්ධයෙන් කටයුතු කිරීම කොමිෂන් සභාවේ එක් ප්‍රධාන කාර්යයක් වන අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLXIII පරිච්ඡේදය සම්බන්ධයෙන් නිකුත් කර ඇති 30/2019 දරන හා 2019 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කර මාස 06 ක් ඇතුළත එය නිම කළ යුතු බව සඳහන් වුවද නියැදි විගණන පරීක්ෂණයට ලක් කළ විනය කටයුතු 08 ක එම ඉල්ලීම් ලැබී වසර 02 සිට වසර 04 දක්වා කාලයක් ගතවී	2023	අංක 30/2019 දරන හා 2019 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	-	මේ වන විට ඉන් විනය කටයුතු හතරකට තීරණ ලබා දී ඇති අතර PSC/DIS/059/2019 සැසිවාර හතක් PSC/DIS/060/2019 සැසිවාර විසිතුනක් PSC/DIS/043/2021 හා PSC/DIS/056/2021 සැසිවාර හතරක් බැගින් පවත්වා ඇත.

	තිබුණද 2024 පෙබරවාරි 24 දින වන විටත් එම විනය කටයුතු අවසන්ව නොතිබුණි.				
(ආ)	කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව, ආයතන අංශය, විනය අංශය, පත්කිරීම් අංශය හා උසස් කිරීම් අංශය විසින් 2023 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන් සංඛ්‍යාව පමණක් කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කර තිබු අතර සමාලෝචිත වර්ෂය තුල අංශයට ලැබුණු පැමිණිලි සංඛ්‍යාව, එම පැමිණිලි තුලින් නිම කළ ප්‍රමාණය සහ තවදුරටත් ඉතිරිව පවතින ප්‍රමාණය යන තොරතුරු ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව 2023 කාර්යසාධන වාර්තාව තුල 2023 වර්ෂයේ කාර්ය සාධන මට්ටම සලකා බැලීමට තරම් ප්‍රමාණවත් කරුණු ඇතුළත් කර නොතිබුණි.	2023	කාර්යසාධන වාර්තාව තුල වර්ෂයේ කාර්ය සාධන මට්ටම සලකා බැලීමට තරම් ප්‍රමාණවත් කරුණු ඇතුළත් කළ යුතු වීම.	-	2024 වර්ෂයේදී කාර්ය සාධන වාර්තාව සඳහා අදාල අංශයන් වෙත පොදු ආකෘතියක් මඟින් ඔබ විසින් ඉල්ලුම් කර ඇති පරිදි අදාල දත්ත ලබා දීමට උපදෙස් ලබා දී ඇත.
(ඇ)	2023 වර්ෂයේ අභියාචන අංශයට ලැබුණු අභියාචනා ප්‍රමාණය ප්‍රමාණාත්මකව දක්වා තිබුණද, නිරීක්ෂණ හා නිර්දේශ සහිත වාර්තා කැඳවූ අභියාචනා ගණන සහ කටයුතු නිම කළ අභියාචනා ප්‍රමාණය ඉදිරිපත් කිරීමේදී එය සමාලෝචිත වර්ෂයේ	2023	කාර්යසාධන වාර්තාව තුල වර්ෂයේ කාර්ය සාධන මට්ටම සලකා බැලීමට තරම් ප්‍රමාණවත් කරුණු ඇතුළත් කළ යුතු වීම.	අභියාචනා අංශය වෙත ලැබෙන අභියාචනා සම්බන්ධයෙන් අදාල අමාත්‍යාංශ වෙතින් නිරීක්ෂණ නිර්දේශ ඇතුලත් වාර්තා හා ලිපිගොනු ගෙන්වා ගැනීම සඳහා අභියාචනා අංශය මඟින් කඩිනමින් කටයුතු	අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් අදාල වාර්තා කඩිනමින් ගෙන්වා ගැනීමට පනවා ඇති අභ්‍යන්තර ස්ථාවර නියෝග පරිදි කටයුතු කරනු ලැබේ.

සහ පෙර වර්ෂයන්හි අභියාචනා ප්‍රමාණයද ඇතුළත්ව ඉදිරිපත් කර තිබුණු අතර එහි කාල විශ්ලේශනයක් ඉදිරිපත් කර නොතිබුණි. එම හේතුවෙන් එම අංශයේ සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන මට්ටම නිශ්චය කිරීමට ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

කරනු ලැබේ. අදාල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් වාර්තා කැඳවූව ද එකී වර්ෂය තුලම එම වාර්තා නොලැබෙන අතර එම හේතුව මත අභියාචනා ලද වර්ෂය තුලම කොමිෂන් සභා තීරණය ලබා දීමට නොහැකි වී ඇත.

3.4 පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	මතය
	රු.	රු.	රු.	
2021	22,144,990	22,144,990	22,144,990	තත්ත්වාගණනය නොකළ
2022	22,266,140	22,266,140	22,266,140	තත්ත්වාගණනය නොකළ
2023	22,395,390	22,395,390	22,395,390	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාර පනතේ 7 වන වගන්තිය අනුව අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයක් එම අභියාචනය ලැබී මාස 2 ක් ඇතුළත විභාග කර අවසාන වශයෙන් සුදුස්සක් කළ යුතු බව සඳහන්ව තිබුණද අධිකාරයට ලැබී තිබූ අභියාචනා වලින් 2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 සිට වර්ෂ 03 ට අඩු විසඳීමට පවතින අභියාචනා 412 ක්ද වර්ෂ 03ට වැඩි වර්ෂ 05 ට අඩු විසඳීමට පවතින අභියාචනා 354 ක් ද හා වර්ෂ 5 ට වැඩි විසඳීමට පවතින අභියාචනා 47ක්ද පැවතුනි.	2022	පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව අධිකාරය වෙත ඉදිරිපත් කරන යම් අභියාචනයක් එය ලැබුණු දින සිට මාස 02 ක් ඇතුළත විභාග කර යම් සුදුස්සක් කළ යුතු වේ.	පනතේ එසේ සඳහන් වුවද එය විධානාත්මක නොවන බවත් උපදේශාත්මක වන බවත් නීතිපතිතුමා අර්ථකථනය කර ඇත. පනත සංශෝධනය කිරීම සඳහා ජනාධිපති ලේකම් වෙත යොමු කර ඇතත් මෙතෙක් පිළිතුරු ලැබී නැත.	නව සභාපතිවරයෙකු 2024.09.18 දින සිට පත්වීමෙන් පසු විශේෂිත වැඩසටහනක් පවත්වා, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිෂන් සභාව, ජාතික විගණන සේවා කොමිෂන් සභාව දැනුවත් කර කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි අවධානය යොමු කර ඒ අනුව කටයුතු කරනු ලැබේ.

(ආ)	2022 වර්ෂය තුල අධිකාරය වෙත ලැබී තිබුණු අභියාචනා 252 න් විසදා අවසන් කර තිබුණේ අභියාචනා 06 ක් පමණි. එය ලැබුණු අභියාචනා වලින් සියයට 2.38 ක් පමණක් විය.	2022	අභියාචනා විසදීම ප්‍රමාද වීමට බලපාන හේතු හඳුනාගෙන ඊට පිළියම් යොදමින් ප්‍රමාදය අවම කර ගත යුතු වේ.	2022 වර්ෂය තුළ විසඳා ඇති සමස්ථ අභියාචන සංඛ්‍යාව 208 ක් වූ අතර වර්ෂය තුළ ලද අභියාචන විසඳීම කෙරෙහි රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිෂන් සභාව හා අභියාචකයන් අධිකාරය වෙත ඉදිරිපත් කළ යුතු වාර්තා, ලේඛන ආදිය නිසි කාලසීමාව තුළ ඉදිරිපත් නොකිරීම හා විමසීම් සඳහා ලබා දී ඇති දිනයන්හි දෙපාර්ශවයෙන් එක් පාර්ශවයක් පෞද්ගලික හෝ රාජකාරි හේතූන් මත වෙනත් දින අයදීම් ආදි හේතූන් ප්‍රමාදවීම් සඳහා බලපා ඇත.	අභියාචකගේ ඉල්ලීම් මත කල් ඉල්ලීම, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිෂන් සභාව නිරීක්ෂණ ඉදිරිපත් කිරීම ප්‍රමාද කිරීම නිසා විසඳුම් ලබාදීමට ප්‍රමාදවන අතර, ඒවා වැලකීමට කටයුතු කරන ලෙස එම කොමිෂන් සභා හා අභියාචකයින් දැනුවත් කර ඇත. දැනට යම් ප්‍රවණතාවයක් ඇත.
(ඇ)	අධිකාරය පිහිටුවා වසර 21 කට අධික කාලයක් ගත වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එක් එක් තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටි සකස් කර නොතිබුණි.	2023	බඳවා ගැනීමේ පරිපාටි අනුමත කරවාගෙන අවශ්‍ය තනතුරුවල බඳවාගැනීම් සිදු කළ යුතු වේ.	බඳවා ගැනීමේ පරිපාටි සකස්කර අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.	බඳවා ගැනීම් පරිපාටි අනුමත වූ පසු අදාල තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

3.5 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	මතය
	රු.	රු.	රු.	
2021	109,609,946	109,609,946	109,506,387	තත්ත්වාගණනය නොකළ
2022	110,674,395	110,674,395	109,094,275	තත්ත්වාගණනය නොකළ
2023	110,792,177	110,792,177	110,726,588	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	කොමිෂන් සභාව විසින් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාල සීමාව තුල අධ්‍යාපන අමාත්‍යාංශයට, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හා ශ්‍රී ලංකා පොලිසියට අදාලව ලබා දී තිබුණු නිර්දේශ 147 න් විගණිත දිනය වන 2022 පෙබරවාරි 14 දින වන විට ක්‍රියාත්මක වී තිබුණේ ලබාදුන් නිර්දේශ වලින් සියයට 44 ක් එනම් නිර්දේශ 64 ක් පමණි.	2021	ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කළ යුතු වේ.	කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක නොවීම පිළිබඳව නැවත සලකා බැලීම සඳහා කොමිෂන් සභාව විසින් ඒ සඳහා පරීක්ෂණ හා විමර්ශන අංශය විසින් වෙනම ඒකකයක් පිහිටුවා නිර්දේශ ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් පසු විපරම් කරමින් පවතී.	ක්‍රියාත්මක නොවූ නිර්දේශ ක්‍රියාත්මක කරලීම සඳහා අදාළ වර්ෂයේ 2024.10.11 දිනට නිර්දේශ 49ක් පසු විපරම් කර අවසන් කර ඇත. අදාළ වගඋත්තරකරුවන් කැඳවමින් ඉතිරි නිර්දේශ ක්‍රියාත්මක වීම පිළිබඳව පසු විපරම් කරමින් පවතී.
(ආ)	මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් 2020 හා 2021 වර්ෂවල පොලිස් ස්ථාන, රැඳවුම් මධ්‍යස්ථාන හා බන්ධනාගාර නිරීක්ෂණය කර විමර්ශණ නිලධාරියා ඒ පිළිබඳ සකස් කරන වාර්තාවල සඳහන් කළ	2021	පොලිස් ස්ථාන, රැඳවුම් මධ්‍යස්ථාන හා බන්ධනාගාර නිරීක්ෂණය කර විමර්ශණ නිලධාරියා විසින් සකස් කරන	ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක නොවීම පිළිබඳව නැවත සලකා බැලීම සඳහා කොමිෂන් සභාව විසින් ඒ සඳහා පරීක්ෂණ හා	විගණකාධිපති නිරිදේශ අනුව පොලිස් ස්ථාන රැඳවුම් ස්ථාන බන්ධනාගාර නිරීක්ෂණය කරන ලද විමර්ශණ නිලධාරීන්ට අනාවරණය වූ

	යුතු වැදගත්ම කරුණු ලෙස දක්වා ඇති ස්ථාන නිරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු, ඒ සම්බන්ධයෙන් තමාගේ නිගමනයන් හා ගනු ලැබූ පියවරයන් කවරේද යන්න ඇතුළත් කර නොතිබුණි. තවද එම වාර්තාව කවරෙකු වෙත යොමු කරන්නේද යන්න සඳහන්ව නොතිබුණු අතර එම වාර්තාව වෙනත් නිලධාරියකු විසින් පසු විපරම් කරන බවට සාක්ෂි නොවීය.		වාර්තාවේ එම ස්ථාන නිරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු හා ඒ සම්බන්ධයෙන් තමාගේ නිගමනයන්ද, ගනු ලැබූ පියවරයන් කවරේද යන්නද ඇතුළත් කළ යුතු වේ.	විමර්ශන අංශය විසින් වෙනම ඒකකයක් පිහිටුවා නිර්දේශ ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් පසු විපරම් කරමින් පවතී.	කරුණු සම්බන්ධයෙන් නිගමන හා ගනු ලැබූ පියවර කවරේ ද යන්න ඇතුලත් කල යුතු බවට මාතර කාර්යාලය වෙත උපදෙස් ලබා දී ඇති අතර, ඒ අනුව ක්‍රියාත්මක වෙමින් පවතී.
(ඇ)	කොමිෂන් සභාව විසින් 2004 ජනවාරි 01 දිනෙන් පසු අත්පත් කර ගත් වත්කම් පමණක් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුළත් කර තිබුණු අතර 2004 වර්ෂයට පෙර පැවති වත්කම් හඳුනාගෙන නොතිබුණි.	2021 2022	සභාව සතු සියළුම වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ.	තක්සේරු මණ්ඩලයක් පත්කර සියලුම භාණ්ඩ තක්සේරු කිරීමට කටයුතු කර ඇති අතර, 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අවසන් කළ පසු සමීක්ෂණ කටයුතු ආරම්භ කිරීමට නියමිතය.	2024 වර්ෂයේ අවසන් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.
(ඈ)	කොමිෂන් සභාව විසින් එක් එක් ආයතන වෙත 2019 සිට 2023 දක්වා වර්ෂ වලදී ලබාදී තිබූ නිර්දේශ වලින් ක්‍රියාත්මක කර තිබුණේ පිළිවෙලින් සියයට 25, 18, 25, 30 හා 18 ක ප්‍රතිශතයක් පමණක් විය..	2023	කොමිෂන් සභාව විසින් ලබාදෙන නිර්දේශ අදාල ආයතන විසින් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කළ යුතු වීම හා ක්‍රියාත්මක නොකරන නිර්දේශ සම්බන්ධයෙන්	කොමිෂන් සභාව නිර්දේශයක් ලබාදීමෙන් පසු ඒ පිළිබඳ ක්‍රියාත්මක කිරීම අදාළ ආයතන වල නිලධාරීන්ගේ වගකීම වන අතර එය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 17/2005 මගින්ද පැහැදිලි කර ඇත. එය ක්‍රියාත්මක කිරීමට ප්‍රායෝගික ගැටලු පවතී නම් ඒ බව කොමිෂන් සභාව	2019 සිට 2022 දක්වා ලබාදී තිබූ නිර්දේශ අතරින් ක්‍රියාත්මක නොවූ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා පැමිණිලිකරුවන් සහ අදාළ ආයතනය කැඳවා පසු විපරම් සිදු කිරීම තවදුරටත් සිදු කිරීමෙන් පසුව පැමිණිලිකරුවන් ඒ පිළිබඳ තවදුරටත් ඉදිරිපත් නොවීම හා අධිකරණය හමුවේ

			කොමිෂන් සභාවට ගත හැකි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කොමිෂන් සභා පනතේ සංශෝධනයක් සිදු කළ යුතු වීම.	වෙත දන්වා සාකච්ඡා කිරීම එම ආයතන සතු වගකීමකි. එසේම පැමිණිලිකරුවන්ට නිර්දේශයක් නිකුත් කිරීමේදී එය ක්‍රියාත්මක වීමට නියමිත අවසන් දින සිට දින 07ක් තුළ දන්වන ලෙසත් නැතහොත් ඒ පිළිබඳව තවදුරටත් කටයුතු නොකරන බවත් නිශ්චිතව අදාළ නිර්දේශයේ සටහන් කර යවන බවද සඳහන් කර ඇත.	නඩු විභාගය පවතින පැමිණිලි පසු විපරම් අංශයෙන් ඉවත් කර ලේඛණාගාරය වෙත වෙත යොමු කර ඇති අතර තවදුරටත් නිර්දේශ ක්‍රියාත්මක නොවූ පැමිණිලි පිළිබඳ කටයුතු කරමින් සිටී. කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම පිළිබඳ සිවිල් සමාජ සාමාජිකයන් හා අදාළ අනෙකුත් පාර්ශවයන් සමග සාකච්ඡා කර අදහස් ලබා ගැනීමෙන් අනතුරුව සිදු කිරීමට කොමිෂන් සභාවේ අවධානය යොමු කර ඇත.
(ඉ)	1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 11(ඊ) වගන්තිය අනුව කොමිෂන් සභාව මානව අයිතිවාසිකම් පිළිබඳව පර්යේෂණ පැවැත්වීම සහ ඒ පර්යේෂණවල ප්‍රතිඵල ප්‍රචාරනය කිරීම හා බෙදාහැරීම කළ යුතු වුවද එවැනි පර්යේෂණ සිදුකර නොතිබුණු අතර මානව හිමිකම් සම්බන්ධ කාර්යයන් 2ක මැදිහත්වීම් ආරම්භ කර තිබුණි.	2023	ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 11(ඊ) වගන්තිය අනුව කටයුතු කළ යුතු වීම	ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පර්යේෂණ සහ අධීක්ෂණ අංශය තුළ පැවති සීමිත මානව සහ මූල්‍ය පහසුකම් සීමාව තුළ වුවත් මානව හිමිකම් පිළිබඳ පර්යේෂණ සිදු කිරීම සහ ඒ අනුව හඳුනාගත් දැනුම ප්‍රචාරය කිරීම සහ සිදුකළ යුතු ප්‍රායෝගික මැදිහත්වීම් 02 ක් එනම් අපනයන නිෂ්පාදන කලාප වල තාවකාලික පදනම මත ශ්‍රමිකයින් ලබා දෙන ආයතන වල ශ්‍රමිකයින්ගේ හිමිකම්	අදාළ සමීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින අතර, තෝරාගත් ක්ෂේත්‍ර 02 ක සමීක්ෂණ වාර්ථා 2024 වසර අවසානය වන විට ප්‍රසිද්ධ කිරීමට කටයුතු යොදා ඇත.

				සම්බන්ධයෙන් අදාළ මැදිහත්වීම් හා 2023 මාතර නිල්වලා ගංගාව පදනම් කරගෙන සිදුවූ ගංවතුර ගැලීම පිළිබඳ මැදිහත්වීම් 2023 වසර තුළද සිදු කර ඇත.	
(ඊ)	ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල 10 වෙත දිනකට ලැබෙන පැමිණිලි සංඛ්‍යාව සාමාන්‍ය පිළිවෙලින් 30 ක් හා 56 ක් පමණ විය. එසේම වර්තමානයේ ප්‍රධාන කාර්යාලය සතුව දත්ත ඇතුළත් කළ හැකි පරිගණක 28 ක් හා ප්‍රාදේශීය කාර්යාල සතුව දත්ත ඇතුළත් කළ හැකි පරිගණක 26 ක් තිබියදී විගණිත දින වන 2024 මාර්තු 31 දින වන විටත් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.	2023	දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතු වීම. පැමිණිලි විභාග සඳහා පැවරීම විධිමත් කිරීම හා කාර්ය සාධනය සම්බන්ධව අධීක්ෂණය ශක්තිමත් කිරීම කළ යුතුය.	දැනට පවතින පරිගණක උපයෝගී කරගෙන හා ස්කෑන් යන්ත්‍ර උපයෝගී කරගෙන දත්ත ඇතුළත් කිරීම කරනු ලබයි. 2024 වර්ෂයේ පරිගණක යන්ත්‍ර හා ස්කෑන් යන්ත්‍ර දැනට මිලදී ගෙන ඇති බැවින් ඉදිරියේදී යාවත්කාලීන කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.	දත්ත පද්ධතිය යාවත්කාලින කරමින් පවතී.දත්ත පද්ධතියේ සිදුකල යුතු යම් යම් වෙනස්කම් ජාල පරිපාලක හා අදාළ ආයතනයේ මැදිහත් වීම මත සිදු කරමින් පවතී.එසේම දත්ත පද්ධතිය ක්‍රියාතමක වීමේදී ඇතිවන තාක්ෂණික දෝෂ නිවැරදි කර ගනිමින්, තවදුරටත් යාවත්කාලින කරමින් පවතී.
(උ)	2024 පෙබරවාරි 09 දින විගණයට ඉදිරිපත් කළ හියුරින් පරිගණක දත්ත පද්ධතිය මඟින් ලබා දුන් තොරතුරු අනුව 2020 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වර්ෂ 04 ක කාල සීමාවේදී ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය කාර්යාලවල නිලධාරීන් 57 දෙනෙකු අතර පැමිණිලි 9728 ක් විභාග කිරීම සඳහා බෙදා දී තිබුණි. එම කාලය තුළදී	2023	දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතු වීම.	2020.01.01 දින සිට 2023.12.31 දින දක්වා හියුරින් පද්ධතියට පැමිණිලි 9728 ක තොරතුරු ඇතුළත් කර ඇත. එම තොරතුරු අනුව නිලධාරීන් 57 දෙනෙකු අතර එම ගොනු බෙදී ගොස් ඇත. එහිදී එම ලිපිගොනු නීති නිලධාරීන් හා මානව හිමිකම් නිලධාරීන් සංවර්ධන	පැමිණිලි විභාග කිරීමේ විධිමත් ක්‍රමවේදයක් සකසා ඇති අතර එම පැමිණිලි විභාග කිරීම අධීක්ෂණය කිරීමද එයට ඇතුලත් වන අතර ඒ අනුව ක්‍රියාත්මක කිරීමට හා පැමිණිලි විභාග කිරීමට පියවර ගනිමින් පවතී.

	ඉන් පැමිණිලි 1654 ක් අවසන් කර තිබූ අතර තවදුරටත් පැමිණිලි 8074 ක් විමර්ශන කිරීමට නියමිතව තිබූ බවත් අදාල කාලය තුල නිලධාරීන් 29 දෙනෙකු කිසිදු පැමිණිල්ලක් විභාග කර අවසන් කර නොතිබූ බව නිරීක්ෂණය වේ. නිලධාරීන්ට පැමිණිලි පැවරීම පිළිබඳවද නිසි ක්‍රමවේදයන් නොතිබුණු අතර දත්ත පද්ධතියට අනුව වර්ෂ 4 ටම පැමිණිලි 50 කටත් වඩා අඩුවෙන් විභාග කර නිර්දේශ ලබා දුන් නිලධාරීන් ගණන 24 දෙනෙක් විය.			නිලධාරීන්ගේ නමින් ඇතුළත් වී ඇත. නිසි පරිදි හියුරින් පද්ධතිය යාවත්කාලීන කිරීම පිළිබඳ 2024.03.18 දින අදාළ නිලධාරීන් කැඳවා සාකච්ඡා කරන ලද අතර, එහිදී ගන්නා ලද තීරණ අනුව ඉදිරි පියවරයන් ගනිමින් සිටී.	
(ඌ)	1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 9(3) වගන්තිය අනුව අනෙකුත් විධි විධානයන්ට යටත්ව කොමිෂන් සභාව විසින් එහි රැස්වීම් පැවැත්වීම හා එම රැස්වීම්වලදී කටයුතු කිරීම පිළිබඳව කාර්යය පටිපාටියක් සකස්කළ හැකි වුවත් කොමිෂන් සභාව ස්ථාපිත කර වර්ෂ 27 ක් ගත වී තිබුණද එවැනි කාර්ය පටිපාටියක් සකස් කර නොතිබුණි.	2023	1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 9(3) වගන්තිය අනුව කොමිෂන් සභා රැස්වීම් පැවැත්වීම හා එම රැස්වීම්වලදී කටයුතු කිරීම පිළිබඳව කාර්යය පටිපාටියක් සකස් කළ යුතු වීම.	මේ සඳහා කොමිෂන් සභා රැස්වීමේදී ගන්නා ලද තීරණයක් අනුව ලේකම්වරයා විසින් අදාළ අංශ වෙත දැනුම්දී ඇත.	1996 අංක 21 දරණ පනත වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කිරීමට පියවර ගැනීමට අවධානය යොමු වී ඇති අතර ඊට සමගාමීව පටිපාටී සකස් කිරීමටද කටයුතු කිරීම සඳහා පියවර ගැනීමට නියමිතය.

(එ)	කොමිෂන් සභා රැස්වීම්වලදී ගන්නා ලද තීරණ සඳහා කොමිෂන් සභා සාමාජිකයන්ගේ එකඟතාවයන් හෝ නොඑකඟතාවයන් ලිඛිතව ලබාගෙන නොතිබීම නිසා 2023 පෙබරවාරි 15 දින පැවැත්වූ රැස්වීමේදී සාකච්ඡා කර තිබූ කොමිෂන් සභා පත්‍රිකාවලට පරිබාහිර එක් කරුණක් ඇතුළත් කර එය 2023 මාර්තු 29 දින පවත්වා තිබූ රැස්වීමේදී අනුමත වූ බව දන්වා ලේකම්වරයා විසින් අදාල තීරණය එක් එක් අංශය වෙත බෙදා හැර තිබුණද එම තීරණය සඳහා කොමිෂන් සභා සාමාජිකයන්ගේ එකඟතාවය ලැබුණේද යන්න සනාථ කර ගත නොහැකි විය.	2023	1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 9(3) වගන්තිය අනුව කොමිෂන් සභා රැස්වීම් පැවැත්වීම හා එම රැස්වීම්වලදී කටයුතු කිරීම පිළිබඳව කාර්යය පටිපාටියක් සකස් කළ යුතු වීම.	මේ සඳහා කොමිෂන් සභා රැස්වීමේදී ගන්නා ලද තීරණයක් අනුව ලේකම්වරයා විසින් අදාළ අංශ වෙත දැනුම්දී ඇත.	මාණ්ඩලික රැස්වීම් වල ක්‍රියාපටිපාටිය විටින් විට පත්වන කොමිෂන් සභා විසින් සාකච්ඡා කොට අනුමත කරගත් ක්‍රමවේදයකට අනුව මෙතෙක් ක්‍රියාත්මක වෙමින් පවතී.
(ඒ)	යාපනය ප්‍රාදේශීය කාර්යාලයේ පැමිණිලි ගොනු නියැදියක් පරීක්ෂා කිරීමේදී ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිලධාරී විසින් පැමිණිලි 05 ක යොමු අංක සඳහා වෙනත් පැමිණිලි ඇතුළත් කර වෙනස් කර තිබුණි.	2023	ප්‍රාදේශීය කාර්යාල වල කාර්යයන් නිසි ලෙස අධීක්ෂණය කලයුතු වීම.	යාපනය ප්‍රාදේශීය කාර්යාලයේ කටයුතු පවත්වාගෙන යාමේදී එහි පැවති සේවක හිඟය මත සීමාවාසික සිසුන්ගේ සහාය ඇතිව කාර්යාල කටයුතු පවත්වාගෙන ගිය අතර, ඔවුන් විසින් ලේඛන වලට දත්ත ඇතුළත් කිරීමේදී ප්‍රමාද දෝෂයකින් එකම පැමිණිල්ල දෙවරක් ලේඛනගත වීම මත එය නිවැරදි කිරීමට කටයුතු කිරීම සිදු කර	ප්‍රාදේශිය කාර්යාල වල කායීයන් නිසි ලෙස අධීක්ෂණය කිරිමට අවශා පියවර ගෙන ඇති අතර ඉහත ප්‍රමාදයන් ඇති නොවීමට කටයුතු කර ඇත.

				ඇත.	
(ඔ)	යාපනය ප්‍රාදේශීය කාර්යාලයේ පැමිණිලි සටහන් කිරීමේ ලේඛණයේ පැමිණිලි 35 ක පැමිණිලිකරුගේ නම, ලිපිනය, පැමිණිල්ල පිළිබඳ විස්තරය සහ පැමිණිල්ලට පිළිතුරු ලබාදිය යුතු පාර්ශවය ආදී තොරතුරු ටිපෙක්ස් භාවිතා කර වෙනස් කර තිබුණු අතර යොමු අංක 23 ක තොරතුරු කිසිවක් සටහන් නොකර හිස්ව පැවතුණි.	2023	ප්‍රාදේශීය කාර්යාල වල කාර්යයන් නිසි ලෙස අධීක්ෂණය කලයුතු වීම	තොරතුරු ලේඛනයට ඇතුළත් කිරීමේදී සිදුවූ ප්‍රමාද දෝෂයන් නිවැරදි කිරීමට ටිපෙක්ස් භාවිතා කර ඇති අතර, කිසිඳු ලිපිගොනුවක් ඉවත් කර නොමැත.	ප්‍රාදේශිය කාර්යාල වල කාර්යයන් නිසි ලෙස අධීක්ෂණය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර, යම් ප්‍රමාද දෝෂයක් මග හැරීමට ටිපෙක්ස් කර තිබූ අතර, කිසිදු ලිපි ගොනුවක් ඉවත් කිරීම සිදු කර නෙමැත

3.6 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	මතය
	රු.	රු.	රු.	
2021	1,632,794,669	1,632,794,669	1,632,773,633	තත්ත්වාගණනය කළ
2022	1,633,227,345	1,633,227,345	1,633,195,784	තත්ත්වාගණනය කළ
2023	2,241,644,739	2,241,644,739	2,241,538,353	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	කොමිෂන් සභාව විසින් පවරන ලද නඩුවලින් 2019 හා 2020 වර්ෂවලදී නඩු 10 ක් විවිධ හේතු මත ඉල්ලා අස්කරගෙන තිබුණු අතර 2021 වර්ෂයේදී නඩු 39 ක් ඉල්ලා අස්කරගෙන තිබුණි. එම නඩු 39 න් 2015 වර්ෂයට පෙර පවරන ලද නඩු 5 ක් වූ අතර 2019 වර්ෂයේදී පවරන ලද නඩු 2 ක් විය. ඉතිරි නඩු 32, 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා පැවරූ නඩු විය.	2021	ඉල්ලා අස්කරගෙන ඇති නඩුවල පැවති තාක්‍ෂණික දෝෂ මගහරවාගෙන නැවත නඩු පැවරීම කළ යුතු වේ.	තාක්‍ෂණික දෝෂ නිවරදිකර නැවත නඩු පැවරීමට කටයුතු කිරීම.	ඉල්ලා අස්කරගත් නඩු වලින් නැවත නඩු පැවරීමට හැකියාව ඇති සහ කොමිෂන් සභාව විධානය කරන ලද නඩු පමණක් පවරා ඇත
(ආ)	1954 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 30(අ)(3) වගන්තිය ප්‍රකාරව වැටලීම්වලට යොදා ගන්නා මුදල් නෝට්ටු සඳහා මහේස්ත්‍රාත්	2022	කොමිෂන් සභා පනත ප්‍රකාරව කටයුතු කළයුතු වේ.	අධිකරණය වෙත ඉල්ලීම් ඉදිරිපත් කිරීමට නීති නිලධාරීන්ට දැනුම් දී ඇත.	2023.06.22 පැවැත්වූ කොමිෂන් සභා රැස්වීමේදී අධිකරණයේ එකඟතාවය මත හැකිතාක් දුරට මුදල් මුදා හැරීමට කටයතු කරන ලෙස උපදෙස් ලැබුණු අතර ඒ

	අධිකරණයේදී මුදල් සහතිකයක් නිකුත් කරනු ලබන බැවින් හැකි සෑම විටම මුදල් සහතිකයක් අධිකරණයට ඉදිරිපත් කළ හැකි වුවද, ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.39,716,535 ක රජයේ මුදල් නඩු භාණ්ඩ නිලධාරියා භාරයේ පැවතුණි.				අනුව අදාල එකඟතාවයන් මත මුදල් නිදහස් කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.
(ඇ)	කොමිෂන් සභාව විසින් 2021 වර්ෂයේදී නඩු 69 ක් අවසන් කර තිබුණු අතර ඉන් නඩු 40 ක් එනම් සියයට 58 ක් නඩු ඉල්ලා අස් කර ගැනීම් විය. නඩු 18 ක වුදිතයින් නිවැරදිකරු වී තිබුණු අතර වරදකරු වි තිබුණේ නඩු 11 ක වුදිතයින් පමණි. 2022 වර්ෂයේදී නඩු 89 ක් පවරා ඉන් නඩු 45 ක් විවිධ හේතූන් මත ඉල්ලා අස් කරගෙන තිබුණි. 2022 දෙසැම්බර් 19 දින වන විට නැවත නඩු පවරා තිබුණේ ඉන් නඩු 20 කට පමණි.	2022	ඉල්ලා අස්කර ගත් නඩු සම්බන්ධයෙන් කඩිනමින් නැවත නඩු පැවරීමහෝවෙ නත් සුදුසු කටයුත්තක් කළ යුතු වේ.	තාක්ෂණික දෝෂ නිවරදිකර නැවත නඩු පැවරීමට කටයුතු කිරීම.	ඉල්ලා අස්කරගත් නඩු වලින් නැවත නඩු පැවරීමට හැකියාව ඇති සහ කොමිෂන් සභාව විධානය කරන ලද නඩු පමණක් පවරා ඇත.
(ඇ)	2021 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ නීති අංශය සතුව වැඩ අවසන් නොකළ ලිපිගොනු 1,508 ක් පැවතුණි. ඉන් ලිපිගොනු 489 ක් වසර 05 ට වැඩි කාලයකටද ලිපිගොනු 33 ක් වසර 10 කට අධික කාලයක සිට පැවති ලිපිගොනු විය. 2022 දෙසැම්බර් 31 දිනට	2022	ලිපිගොනුවල වැඩ අවසන් කර නීති වාර්තා සකස් කිරීමෙන් කාර්යසාධනය ඉහල නංවා ගතයුතු අතර ලිපිගොනුවල කාල විශ්ලේෂණයක්	කොමිෂන් සභාව විසින් කාල විශ්ලේෂණයන් අධීක්ෂණය කරනු ලබයි.	පරීක්ෂණ අවසන් කර නඩු පැවරීම සඳහා කොමිෂන් සභාව විසින් පොදු චක්‍රලේඛයක් මගින් කාල සීමාවන් නියමකර ඇත. එහෙත් සමහර අවස්ථා වල එක් එක් විමර්ශන වලට අදාල සුවිශේෂී කරුණු මත

	වැඩ අවසන් නොකල ලිපිගොනු 926ක් පැවති අතර එහි කාල විශ්ලේෂණය විගණනයට ඉදිරිපත් නොවීය.		ඉදිරිපත් කිරීමට හැකිවිය යුතු වේ.		අදාල කාල සීමාවට අනුගත වීමට නොහැකි අවස්ථාවන්ද ඇත.
(ඉ)	ශ්‍රී ලංකාව තුළින් අල්ලස් හා දූෂණය තුරන් කිරීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්මට 2019 පෙබරවාරි 5 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු අතර 2019 මාර්තු 18 වැනි දින එහි කටයුතු ආරම්භ කර තිබුණි. විගණන දිනය වූ 2022 දෙසැම්බර් 20 වන විටත් එම සැලැස්ම ආරම්භ කර අවු. 3 ½ ක් පමණ ගතවී තිබුණද එහි සඳහන් කාර්යයන් 27 න් කාර්යයන් 11 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.	2022	ජාතික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් නොපමාව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ.	2019-2023 සැලැස්මේ ක්‍රියාත්මක කාලය වසරකින් දීර්ඝ කරන ලද අතර 2025-2029 දක්වා නව ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකසමින් පවතී.	රට තුල පැවති කොරෝනා වසංගත තත්ත්වය හා ආර්ථික අස්ථාවරත්වය නිසා ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් හා අනිකුත් කරුණු මත ජාතික ක්‍රියාකාරී සැලැස්මේ සමහර අයිතමයන් ක්‍රියාත්මක කිරීමට නොහැකිවිය. නමුත් 2023 හා 2024 වසර වලදී මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදි.
(ඊ)	අල්ලස් පනතේ 30(අ)(3) වගන්තිය ප්‍රකාරව වැටලීම්වලට යොදාගන්නා මුදල් නෝට්ටු සඳහා සෑම විටම මුදල් අධිකරණයට ඉදිරිපත් නොකර මහේස්ත්‍රාත් අධිකරණයේදී මුදල් සහතිකයක් නිකුත් කරනු ලැබිය හැකි වුවද 2023 වර්ෂයේ නඩු භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව 2023 දෙසැම්බර් 31 දිනට රු.33,795,085 ක රජයේ මුදල් නඩු භාණ්ඩ නිලධාරියා භාරයේ පැවතුනි.	2023	අල්ලස් පනතේ 30 (අ) (3) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	අධිකරණය වෙත ඉල්ලීම් ඉදිරිපත් කිරීමට නීති නිලධාරීන්ට දැනුම් දී ඇත.	2023.06.22 පැවැත්වූ කොමිෂන් සභා රැස්වීමේදී අධිකරණයේ එකඟතාවය මත හැකිතාක් දුරට මුදල් මුදා හැරීමට කටයතු කරන ලෙස උපදෙස් ලැබුණු අතර ඒ අනුව අදාල එකඟතාවයන් මත මුදල් නිදහස් කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.

(උ)	2023 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කොමිෂන් සභාව වෙත පැමිණිලි 3431 ක් ලැබී තිබුණු අතර ඉන් පැමිණිලි 2789 ක් පැමිණිලි කමිටුව වෙත ඉදිරිපත් කර තිබුණි. පැමිණිලි කමිටුව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි වලින් ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් කර නොතිබීම සහ අල්ලස් පනතට අදාල නොවීම හේතුවෙන් තවදුරටත් කටයුතු නොකිරීමට නියෝග කරන ලද පැමිණිලි සංඛ්‍යාව 766 ක් වූ අතර කොමිෂන් සභා පනතට අදාල නොවීම හේතුවෙන් ඉදිරි කටයුතු සඳහා වෙනත් ආයතන වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි සංඛ්‍යාව 613 ක් විය. ඒ අනුව පැමිණිලි කමිටුව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලිවලින් සියයට 49 ක් කොමිෂන් සභා පනතට අදාළ පැමිණිලි හෝ ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් නොකරන ලද පැමිණිලි විය.	2023	අල්ලස් පනත සම්බන්ධයෙන් මහජනයා දැනුවත්කිරීම් තවදුරටත් වර්ධනය කළ යුතුය.	*නිවාරණ අංශය මඟින් මහජනයා දැනුවත් කිරීම සිදුකිරීම. *පැමිණිලි තේරීම් කමිටුවට නිවාරණ නිලධාරියකු සම්බන්ධ කර ගැනීම.	පනතට අදාලව පැමිණිලි යොමුකිරීම සම්බන්ධව මහජනතාව දැනුවත් කරන ලෙස නිවාරණ අංශයේ නිලධාරීන් වෙත කොමිෂන් සභාව විසින් උපදෙස් ලබා දීමට කටයුතු කිරීම.
(ඌ)	2006 ජනවාරි 31 දිනට නඩු භාණ්ඩ අපහරණය කිරීම පිළිබඳව පත්කර තිබු කමිටුව මඟින් ගොනු 10 කට අදාල නඩු භාණ්ඩ අයිතම 36 ක් වෙන්දේසියට යොමු කිරීමට නිර්දේශ කර තිබුණු අතර එම නිර්දේශ	2022 2023	2006 ජනවාරි 31 දිනට නඩු භාණ්ඩ අපහරණ කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු වීම.		අදාල හා අධිකරණය වෙත ඉදිරිපත් කිරීමේ ඉදිරි කටයුතු සඳහා නීති අංශය වෙත යොමුකර ඇති අතර ඒ අනුව ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

ලබා දී වසර 18 ක් ගත වී තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම මෙම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

3.7 තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	මතය
	රු.	රු.	රු.	
2021	9,441,683	9,441,683	9,441,683	තත්ත්වාගණනය කළ
2022	8,659,866	8,659,866	10,362,332	තත්ත්වාගණනය කළ
2023	7,115,408	7,115,408	6,560,257	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2019 වර්ෂයේදී කොමිෂන් සභාව වෙත අභියාචනා 1089 ක් ලැබී තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දින වන විට එම අභියාචනා විභාග කර ප්‍රකාශයට පත්කළ නියෝග සංඛ්‍යාව 709 ක් විය. එය ලැබුණු අභියාචනා වලින් සියයට 65 ක් විය. 2020, 2021 හා 2022 වර්ෂයන්හිදී කොමිෂන් සභාව වෙත පිළිවෙලින් අභියාචනා 729 ක්, 800 ක් හා 1,525 ක් ලැබී තිබුණි. එක් එක් වර්ෂයේ ලැබී තිබූ අභියාචනා වලින් එම වර්ෂය තුලදී ප්‍රකාශයට පත්කර ඇති නියෝග සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ලබාගැනීමේ දත්ත පද්ධතියක් හෝ ක්‍රමවේදයක් කොමිෂන් සභාව සකස් කර නොතිබීම හේතුවෙන් 2020, 2021 හා 2022	2022	එක් එක් වර්ෂයේ ප්‍රකාශයට පත්කර ඇති නියෝගවල කාල විශ්ලේෂණයක් ලබාගත හැකිවිය යුතු වේ.	පිළිතුරු ලබාදී නැත.	ප්‍රස්තුත වර්ෂවලදී කාල විශ්ලේෂණය කිරීම සඳහා දත්ත පද්ධතියක් හෝ ක්‍රමවේදයක් ස්ථාපිත වී නොතිබීම හේතු කොට ගෙන කාල විශ්ලේෂණය සම්බන්ධයෙන් තොරතුරු ලබා දීමට නොහැකි වී ඇත. නමුදු 2020, 2021, 2022 හා 2023 වර්ෂයන්හි වාර්ෂික වාර්තා අනුව එක් එක් වර්ෂයේ කොමිෂන් සභාව වෙත ලැබුණු අභියාචනා සංඛ්‍යාව, විභාග කළ අභියාචනා සංඛ්‍යාව හා අවසන් නියෝග නිකුත් කරන ලද අභියාචනා

	වර්ෂවල අභියාචනා විභාග කිරීමේ ප්‍රගතිය පිළිබඳව විගණනයේදී තොරතුරු ලබාගැනීමට නොහැකි විය.				සංඛ්‍යාවපිළිබඳ දත්ත ඇමුණුමක් මඟින් ඉදිරිපත් කර ඇත.
(ආ)	කොමිෂන් සභාවේ කාර්යසාධනය පරීක්ෂා කිරීම සඳහා 2023 දෙසැම්බර් 11 දින ඉල්ලුම් කරන ලද 2023 දෙසැම්බර් 31 දිනට විභාග කිරීමට පවතින අභියාචනා සංඛ්‍යාව හා එහි කාල විශ්ලේෂණ තොරතුරු 2024 අප්‍රේල් 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොවීය.	2023	අභියාචනා සංඛ්‍යාව හා එහි කාල විශ්ලේෂණ තොරතුරු ඉදිරිපත් කල යුතු වේ.	2023 වර්ෂයට අදාළ අභියාචනාවන්හි සංක්ෂිප්ත වාර්තාවක් අභියාචනා අංශය විසින් මේ වන විට සකස් කරමින් පවති.	ප්‍රස්තුත වර්ෂවලදී කාල විශ්ලේෂණය කිරීම සඳහා දත්ත පද්ධතියක් හෝ ක්‍රමවේදයක් ස්ථාපිත වී නොතිබීම හේතු කොට ගෙන කාල විශ්ලේෂණය සම්බන්ධයෙන් තොරතුරු ලබා දීමට නොහැකි වී ඇත.නමුදු 2023 වර්ෂයේ වාර්ෂික වාර්තා අනුව එක් එක් වර්ෂයේ කොමිෂන් සභාව වෙත ලැබුණු අභියාචනා සංඛ්‍යාව, විභාග කළ අභියාචනා සංඛ්‍යාව හා අවසන් නියෝග නිකුත් කරන ලද අභියාචනා සංඛ්‍යාව පිළිබඳ දත්ත ඇමුණුමක් මඟින් ලබාදී ඇත.

3.8 අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	මතය
	රු.	රු.	රු.	
2021	71,951,329	38,814	71,912,515	තත්ත්වාගණනය නොකළ
2022	441,844,650	95,100	441,749,550	තත්ත්වාගණනය කළ
2023	442,556,413	7,839	442,548,574	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.	2023 2022	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	කාර්යාලය තුළ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපනය වෙනුවෙන් සෑම වසරක් පාසාම වර්ෂය ආරම්භයේදී ම ලිඛිතව, විගණන අංශයට ද පිටපතක් සහිතව බලය පැවරීම සිදු කරන අතර, වර්ෂය පුරා අඛණ්ඩව එහි සඵලදායීතාවය පිළිබඳ විමසිල්ලෙන් පසුවන බවද, බලතල පවරන ලද නිලධාරියෙකු විදේශ නිවාඩු ලබාගත් අවස්ථාවේදී වෙනත් නිලධාරියෙකු වෙත බලතල පැවරීම් සිදුකරන ලද බව ද,	කාර්යාල තුළ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපනය වෙනුවෙන් සෑම වසරක් පාසාම වර්ෂය ආරම්භයේ දී ම ලිඛිතව, විගණන අංශයට ද පිටපතක් සහිතව බලය පැවරීම සිදු කරන අතර, වර්ෂය පුරා අඛණ්ඩව එහි සඵලදායීතාවය පිළිබඳ විමසිල්ලෙන් පසු වන බව කිව යුතු ය. ඒ අනුව බලතල පවරන ලද එක් නිලධාරියෙකු විදේශ නිවාඩු ලබාගත් අවස්ථාවේ දී එම පවරන ලද බලතල වෙනුවෙන් වෙනත් නිලධාරියෙකු වෙත

				දන්වා තිබුණි.	බලතල පැවරීම් සිදු කරන ලදී. 2024 වර්ෂය තුළ ද මුදල් රෙගුලාසි 135 බලය පැවරීම සම්බන්ධයෙන් සමාලෝචනය කර වෙනස්කම් සිදු කර ඇත.
(ආ)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛයේ 03 ඡේදයප්‍රකාරවවාහන දෙකක් සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව මාසික වාර්තාව පිළියෙල කර නොතිබුණි.	2023	යොමුගත චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	ලේකම්තුමාට සහ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්තුමාට විශාල භාරදූර කාර්යයන් පැවරී ඇති බැවින්, වාහන ධාවන සටහන් දෛනිකව නඩත්තු කිරීමට හැකියාවක් නොමැති බව දන්වා තිබුණි.	මෙම කොමිෂන් සභාවේ ලේකම්තුමා සහ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්තුමා සඳහා මෙම වාහන 02ක අධිකරණ අමාත්‍යාංශය විසින් ලබා දී ඇත. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරේ සේවය කළ විනිසුරුතුමා 2024 අප්‍රේල් 22 දින සිට මෙම ලේකම් කාර්යාලයෙන් ස්ථාන මාරු වී ගොස් ඇති බව දන්වමි. සමස්ත අධිකරණ පද්ධතියේ අධීක්ෂණය, මෙහෙයවීම් සහ පරිපාලනය අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන අතර එහි ලේකම්තුමාට විශාල භාරදූර කාර්යයන් පැවරී ඇති බැවින් වාහන ධාවන සටහන් දෛනිකව සටහන්

					කර නඩත්තු කිරීමට හැකියාවක් නොමැති බව වැඩිදුරටත් දන්වමි.
(ඇ)	2008 පෙබරවාරි 06 දිනැති සහ 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 සහ 05/2008 (i) දරන චක්‍රලේඛප්‍රකාරවපුරවැසි/ සේවාලාභීප්‍රඥප්තිය හඳුන්වාදීම සෑම රාජ්‍ය ආයතනයක් විසින් සිදුකළ යුතුව තිබුණ ද, කොමිෂන් සභාව විසින් පුරවැසි/ සේවාලාභි ප්‍රඥප්තිය හඳුන්වාදීම සිදුකර නොතිබුණි.	2023 2022	යොමුගත චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතු ය.	අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීමට කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි.	2008 පෙබරවාරි 06 දිනැති සහ 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 සහ 05/2008 (1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීමට කටයුතු කරමින් පවතී.
(ඈ)	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන මාර්ගෝපදේශයේ අංක 13හි ඇතුළත් සවිස්තර ප්‍රසම්පාදන සැලැස්ම, ඉදිරිපත් කරන ලද ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත්කර නොතිබුණි.	2023	යොමුගත චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය	මුළු වසර සඳහා ම එකවර සවිස්තර ප්‍රසම්පාදන සැලැස්ම සකස්කිරීම ප්‍රායෝගික නොවන බැවින්, 2024 වර්ෂයේදී එක් එක් ප්‍රසම්පාදන කාර්යය ආරම්භයේදී ප්‍රසම්පාදන සැලැස්මට අනුකූලව ඊට අදාළ සවිස්තර ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	ප්‍රායෝගික හේතූන් මත ප්‍රසම්පාදනයට අදාළ එක් එක් පියවරයන්වලට අදාළ දින වකවානු වෙනස් වන බැවින් ප්‍රසම්පාදන සැලැස්ම වර්ෂය පුරාවට ම දිගින් දිගට ම වෙනස් කළ යුතු බැවින්, ඒ ඒ ප්‍රසම්පාදනය ආරම්භ වන අවස්ථාවේ දී ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පියවර සහිතව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් 2024 වර්ෂයේ සිට පිළියෙල කර ඇත.

(ඉ)	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් ප්‍රවර්තන වර්ෂයේ පුනරාවර්තන වැඩසටහන් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	2023 වර්ෂයේ ප්‍රාග්ධන වැඩසටහන පමණක් ඇතුළත්කර වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකසා ඇති අතර, 2024 වර්ෂයේ ප්‍රාග්ධන හා පුනරාවර්තන වැඩසටහන් ඇතුළත්ව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කොට ඇති බව දන්වා තිබුණි.	2023 වර්ෂයේ ප්‍රාග්ධන වැඩසටහන පමණක් ඇතුළත් කර වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකසා ඇති අතර, 2024 වර්ෂයේ ප්‍රාග්ධන හා පුනරාවර්ථන වැඩසටහන් ඇතුළත්ව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කොට ඇති අතර, ඉදිරි වර්ෂය සඳහා ද එසේ පුනරාවර්තන වැඩසටහන් ඇතුළත්ව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ.
(ඊ)	2023 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රාග්ධන වියදම් සඳහා රු.500,000ක් සැලසුම්ගතකර තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය තුළ සත්‍ය ප්‍රාග්ධන වියදම රු.201,810ක් විය. ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්මට අනුව සියයට 60ක මිලදීගැනීම් සිදුකර නොතිබුණු අතර, කොමිෂන් සභාව විසින් සැලැසුම් සකස් කිරීමේදී තාත්ත්වික තත්ත්වය සැලකිල්ලට ගෙන නොතිබුණි.	2023	ප්‍රසම්පාදන සැලැස්ම නිවැරදි ලෙස හා වඩාත් තාත්ත්විකව සකස් කළ යුතු ය.	2023 ප්‍රසම්පාදන සැලැස්ම අනුව මිලදීගත යුතු ඩෙස්ක්ටොප් මොනිටර් යන්ත්‍ර 05 ක් වර්ෂය අවසානයේදී මිලදීගත් අතර, භාණ්ඩාගාර අග්‍රිම නොලැබීම මත ගෙවිය යුතු රු.125,000 ක මුදල 2023 දෙසැම්බර් 31 දිනට බැරකම් ලෙස දක්වා ඇත. එබැවින් එම මුදල මෙම වියදමට ඇතුළත් නොවේ.	2023 ප්‍රසම්පාදන සැලැස්ම අනුව මිලදීගත යුතු ඩෙස්ක්ටොප් මොනිටර් යන්ත්‍ර 05 ක් අවශ්‍යතාව පරිදි වර්ෂය අවසානයේදී මිලදීගත් අතර එම ප්‍රසම්පාදනයට අදාළවභාණ්ඩාගාර අග්‍රිම නොලැබීම මත ගෙවිය යුතු රු.125,000 ක මුදල 2023 දෙසැම්බර් 31 දිනට බැරකම් ලෙස දක්වා ඇත. එබැවින් එම මුදල

				අයවැය චක්‍රලේඛ 02/2023 අනුව වියදම් අවම කිරීම සඳහා අබලන්ව පැවති Multi-functional Fax යන්ත්‍රය අලුත්වැඩියා කර භාවිතයට ගැනීම නිසා මෙම තත්ත්වය ඇති වී තිබෙන බව දන්වා ඇත.	මෙම වියදමට ඇතුළත් නොවේ. එසේම අංක BD/CBP/01/01/05/2022 හා 2023 පෙබරවාරි 02 දිනැති අයවැය චක්‍රලේඛ 02/2023 අනුව වියදම් අවම කිරීම සඳහා අබලන්ව පැවති Multi-functional Fax යන්ත්‍රය අලුත්වැඩියා කර භාවිතයට ගැනීම නිසා 2023 ප්‍රසම්පාදන සැලැස්මේ අන්තර්ගත වූ Multi-functional Fax යන්ත්‍රය මිලදී නොගන්නා ලදී.
(උ)	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 150ක් ගතවීමට ප්‍රථම සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත්, 2020,2021 සහ 2022 වර්ෂවල කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුව වෙත සභාගත කිරීම සඳහා පිළිවෙලින්වර්ෂ 01 මාස 09ක්, මාස 08ක් හා වර්ෂ 01 මාස 04ක කාලප්‍රමාදයක් පැවතුණි. 2023 වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව මෙම වාර්තාවේ දින දක්වා	2023 2022	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කාර්යසාධන වාර්තාව නියමිත දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.	2020, 2021 හා 2022 වර්ෂයන්ට අදාළ කාර්යසාධන වාර්තා නියමිත කාලසීමාවේදී ඉදිරිපත් කිරීමට නොහැකි වූ බවත්, 2022 වර්ෂයේ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සූදානම් කර ඇති බව දන්වා තිබුණි.	2020,2021 වර්ෂයන්ටඅදාළ කාර්යසාධන වාර්තාපාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. 2022 වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව 2024 ඔක්තෝබර් 14 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

	පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.				
(ඌ)	2018 අප්‍රේල් 27 දිනැති අංක එම්එස්ඩීඩබ්/08/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලිපිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් 2022 වර්ෂය සඳහා තිරසර සංවර්ධන අරමුණු හා දර්ශක හඳුනාගෙන තිබුණ ද, එම තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධීකරණය කිරීමට නිලධාරීන් පත්කොට තිරසර සංවර්ධන වැඩසටහනක් පිළියෙල කර නොතිබුණි.	2023 2022	යොමුගත ලිපිය පරිදි කටයුතු කළ යුතු ය.	තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලිපිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් 2022 වර්ෂය සඳහා සංවර්ධන අරමුණු හා දර්ශක හඳුනාගෙන එම තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධීකරණය කිරීමට නිලධාරීන් පත්කොට තිරසර සංවර්ධන වැඩසටහනක් පිළියෙල කිරීම සඳහා කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි.	තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධීකරණය කිරීමට නිලධාරීන් පත්කොට තිරසර සංවර්ධන වැඩසටහනක් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
(එ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඡේද අංක 40(1) ප්‍රකාරව කොමිෂන් සභාව අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරීම සඳහා එම කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් පත් කරනු ලබන තමාගේම අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු නමුත්, කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණක තනතුරක් ඇතුළත්කර නොතිබුණි. තවද, 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයෙහි 03 ඡේදය	2023 2022 2021	ජාතික විගණන පනතේ හා චක්‍රලේඛ ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකය පිහිටුවා ගැනීමට කටයුතු කළ යුතු ය.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් අධිකරණ සේවා කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට කාර්ය මණ්ඩලය අනුමත කර තිබුණ ද, කොමිෂන් සභාවේ කටයුතු දැනට සිටින කාර්ය මණ්ඩලයටවත් ප්‍රමාණවත් නොවන	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් අධිකරණ සේවා කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට කාර්ය මණ්ඩලය අනුමත කර තිබුණ ද, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ කටයුතු

	ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ/ ගණන්දීමේ නිලධාරියාගේ සෘජු අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I පන්තිය නිලධාරියෙකුගේ ප්‍රධානත්වය දරන අභ්‍යන්තර විගණන අංශයක් සියලුම විශේෂ වියදම් ඒකක සඳහා ස්ථාපිත කළ යුතු නමුත්, කොමිෂන් සභාව තුළ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිතකර නොතිබුණි.			තාවකාලික ගොඩනැඟිල්ලක පවත්වාගෙන යන බැවින්, එකී විගණන ඒකකය සඳහා අනුමත කාර්ය මණ්ඩලයට ද ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීම හේතුවෙන් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිතකර නොමැති බව දන්වා තිබුණි.	තාවකාලික ගොඩනැඟිල්ලක පවත්වාගෙන යන බැවින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට අනුමත කර ඇති කාර්යය මණ්ඩලය සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීම හේතුවෙන් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නැති අතර, දැනට නවීකරණය කරමින් පවතින අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ අලුත්වැඩියා කටයුතු සිදුකර අවසන් වූ පසු අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන බව දන්වමි.
(ඒ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 117ක් වුව ද, දෙසැම්බර් 31 දින වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 09ක්, තෘතීයික මට්ටමේ තනතුරු 02ක් ද, ද්විතීක මට්ටමේ තනතුරු 29ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 14ක ඌණතාවයක් පැවතුණි.	2023 2022 2021	පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට කටයුතු කළ යුතු ය.	කොමිෂන් සභාවේ කාර්යයන් ඉටු කරගැනීම කෙරෙහි සෘජුවම බලපෑම් ඇති කරනු ලබන තනතුරු 08ක් සඳහා වන පුරප්පාඩු පූරණය කරගනිමින් රාජකාරී ඉටුකර ගැනීමට කටයුතුකර ඇති	අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ කටයුතු දැනට සිටින කාර්ය මණ්ඩලයද ප්‍රමාණවත් නොවන තාවකාලික ගොඩනැගිල්ලක පවත්වා ගෙන යන අතර, අනුමත

				බවත්, කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සිටින නිලධාරීන්ගෙන් පුරප්පාඩුව පවතින තනතුරුවලට අයත් රාජකාරී ආවරණය කරගැනීමට කටයුතුකර ඇති බවත්, අවම සේවක සංඛාවක් රාජකාරි කළ ද, නිසි කළමනාකරණය සහ පරිපාලනය හේතුවෙන් සියලු රාජකාරි කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යන අතර, රජයේ මුදල් උපරිම කාර්යක්ෂමතාවය කින් සඵලදායීව විචක්ෂණශීලී මනා මූල්‍ය පාලනයකින් යුතුව භාවිතාකර ඇති බව ද දන්වා තිබුණි.	සංඛ්‍යාව ඉක්මවා සිටින නිලධාරීන් මගින් දැනට පුරප්පාඩුව පවතින තනතුරුවල රාජකාරී කටයුතු පූර්ණය කර ගැනීමට කටයුතු කර ඇත. අනුමත කාර්ය මණ්ඩලය 117ක් වුවද, නිලධාරීන් 60 දෙනෙකු වැනි අවම සංඛ්‍යාවකින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි සම්පූර්ණ අධිකරණ පද්ධතියේම අධීක්ෂණය, මෙහෙයවීම සහ පරිපාලනයට අදාළ සියලු කටයුතු මෙම ලේකම් කාර්යාලය මගින් නිසිපරිදි පවත්වාගෙන යනු ලැබේ.
(ඔ)	අනුමත කාර්ය මණ්ඩලය තුළ නොමැති අධිකරණ රෙජිස්ට්‍රාර් තනතුරු 03ක් SL 1 වැටුප් තලයෙහි ද, එක් තනතුරක් MN - 6 වැටුප් තලයෙහි ද පිහිටුවා තිබුණි. තවද, අනුමත කාර්ය මණ්ඩලය තුළ ලඝුලේඛන (Court Stenographer) තනතුරු 01ක් MN 2 වැටුප් තලයෙහි අනුමත කර තිබුණ ද, ඊට අමතරව සත්‍ය කාර්ය මණ්ඩලය තුළ ලඝුලේඛන (Court Stenographer) තනතුරු	2023 2021	අනුමත කාර්ය මණ්ඩලය අනුව තනතුරු පිහිටුවිය යුතු ය.	අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන අධිකරණ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා නිලධාරීන් 03 දෙනෙකු සිටින අතර, එම නිලධාරීන් අතරින් එක් නිලධාරියෙකු අධිකරණ රෙජිස්ට්‍රාර් I ශ්‍රේණියට සහ අනිකුත් නිලධාරීන් දෙදෙනා අධිකරණ රෙජිස්ට්‍රාර් II - I ශ්‍රේණියට අයත්	අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන අධිකරණ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා නිලධාරීන් 04 දෙනෙකු සිටින අතර, එම නිලධාරීන් අතරින් එක් නිලධාරියෙකු අධිකරණ රෙජිස්ට්‍රාර් I ශ්‍රේණියට, තවත් නිලධාරීන් දෙදෙනෙකු අධිකරණ රෙජිස්ට්‍රාර් II - I

01ක් MN 7 හි වැටුප් තලයෙහි පිහිටුවා තිබුණි.

නිලධාරීන් බැවින්, ඔවුන්ගේ වැටුප් තලය SL - 1 වේ. එම තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමතකර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් පවතී. තවද, විශ්වාසවන්තභාවයට ගැළපෙන අයුරින් සේවය කිරීම සුදුසු පළපුරුදු නිලධාරියෙකු ලබාගන්නා තෙක් MN – 7 වැටුප් තලයෙහි (රාජ්‍ය සේවයට නව බඳවාගැනීම් අත්හිටුවා ඇති බැවින්) නිලධාරිනිය මඟින් එම කාර්යය පූරණය කරගැනීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි.

ශ්‍රේණියට සහ අනික් නිලධාරියා අධිකරණ රෙජිස්ට්‍රාර් III ශ්‍රේණියට අයත් නිලධාරීන් බැවින් ඔවුන්ගෙන් වැටුප් තලයන් SL – 1 සහ MN – 6 වේ. අධිකරණ පද්ධතියේ අධීක්ෂණය, මෙහෙයවීම සහ පරිපාලනය පිළිබඳ දැනුම සහ පළපුරුද්ද අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන් සතුව පවතින බැවින්, එම තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ගැනීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. දැනට MN – 7 තනතුරෙහි සිටින ලඝුලේඛක නිලධාරිනිය 2013 මැයි 28 දින සිට අධිකරණ සේවා කොමිෂන් සභාවේ විමර්ශන අංශයට සම්බන්ධව කටයුතු සිදු කරනු ලබන පලපුරුදු නිලධාරිනියක් වන අතර, 2013 මැයි 28 දිනට ඇයගේ වැටුප් තලය MN – 2 ය. මෙම නිලධාරිනිය 2021 ජනවාරි 01 දින

					ලසුලේඛක අධිශ්‍රේණියට උසස් වීම ලැබ, MN – 7 වැටුප් තලයට පැමිණයද, මෙම කාර්යාලයේ විශ්වාසවන්ත භාවයට ගැලපෙන අයුරින් සේවය කිරීමට සුදුසු පළපුරුදු නිලධරියෙකු ලබාගන්නා තෙක් (රාජ්‍ය සේවයට නව බඳවාගැනීම් අත්හිටුවා ඇති බැවින්) එම නිලධාරිනිය මගින් එම කාර්යය පූර්ණය කර ගැනීමට කටයුතු කර ඇත .
(ඕ)	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම 2018 වර්ෂයේ සිට සිදුකළ යුතු වුවත්, මේ දක්වා ඒ අනුව කටයුතුකර නොතිබුණු අතර, චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් කොමිෂන් සභාව විසින් පිළියෙල කර නොතිබුණි.	2023 2022 2021	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් සකස් කිරීම හා කාර්යසාධන ගිවිසුම් අත්සන් කළ යුතු ය	මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබූ නමුත්, අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ සහ උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ සියලුම තනතුරුවල නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීම සඳහා අධිකරණවල කාර්යක්ෂමතාවය සහ සඵලදායීතාවය ඉහළ නැංවීමට තුඩුදෙන වඩාත් ප්‍රායෝගික කාර්යසාධන	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන විධිවිධානය අනුව නිසිපරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබූ නමුත්, අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ සහ උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ සියලු ම තනතුරුවල නිලධාරීන්ගේ කාර්ය සාධනය ඇගයීම් සඳහා අධිකරණවල

ඇගයීම් ක්‍රමවේදයක් යෝජනා කිරීම යන අරමුණු ඔස්සේ සමාලෝචනය කර වාර්තා කිරීමට මේ වන විට කමිටුවක් පත්කර එහි කටයුතු අවසන් කර ඇති අතර, අදාළ නිර්දේශ අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත්කර ඒ අනුව සුදුසු ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන බව දන්වා තිබුණි.	කාර්යක්ෂමතාවය සහ සඵලදායීතාවය ඉහළ නැංවීමට තුඩුදෙන වඩාත් ප්‍රායෝගික කාර්යසාධන ඇගයීම් ක්‍රමවේදයක් යෝජනා කිරීම වාර්තා කිරීමට මේ වන විට කමිටුව විසින් සකස් කරන ලද අදාළ නිර්දේශ අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත.

3.9 ජාතික පොලිස් කොමිෂන් සභාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	මතය
	රු.	රු.	රු.	
2021	73,196,341	81,971	73,114,370	තත්ත්වාගණනය නොකළ
2022	71,655,903	6,550	71,649,353	තත්ත්වාගණනය නොකළ
2023	76,301,726	7,950	76,293,776	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2023 වර්ෂයේ ලද මහජන පැමිණිලි 2448 න් මහජන පැමිණිලි 1887 ක එනම් සියයට 77 ක විමර්ශන අවසන්කර නොතිබුණි.	2023	මහජන පැමිණිලි විමර්ශනය කිරීම ප්‍රශස්ථ මට්ටමට පත්කරගත යුතු ය.	2016 වර්ෂයේ සිට 2023 වර්ෂය ද ඇතුළුව ලැබී ඇති මහජන පැමිණිලි 1090 ක විමර්ශන ද 2023 වර්ෂය තුළදී අවසන්කර ඇත.	2023 වර්ෂයේ ලද මහජන පැමිණිලි 2448 න් විගණනය වන අවස්ථාවේදී විමර්ශනය අවසන් කර නොතිබූ පැමිණිලි ප්‍රමාණය 1887 වූ අතර, එයින් පැමිණිලි 354ක වැඩ අවසන් කර ඇත. එය මුළු සංඛ්‍යාවෙන් සියයට 14.46 කි.
(ආ)	ලද මහජන පැමිණිලි ස්වභාවය අනුව මුළු පැමිණිලිවලින් වැඩිම ප්‍රතිශතයක් වූයේ පොලීසිය විසින් ක්‍රියා නොකිරීම, බලය අයථා ලෙස පරිහරණය, පක්ෂග්‍රාහී වීම යන ස්වභාවයේ පැමිණිලි වූ අතර, එය මුළු සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 33, 30 හා 18 ක් පමණ විය. එම පැමිණිලි විමර්ශන අවසන්	2023	මහජන පැමිණිලි විමර්ශනය කිරීම ප්‍රශස්ථ මට්ටමට පත්කරගත යුතු ය.	මහජන පැමිණිලි ලැබෙන දිනය අනුව විමර්ශන ආරම්භකර කටයුතුකර ඇති අතර, පැමිණිල්ලේ ස්වභාවය අනුව වර්ගකර විමර්ශන අවසන් කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙතෙක් සිදුකර නොමැති වුවත්,	මහජන පැමිණිලි විමර්ශන අංශයට ලද පැමිණිලිවල ස්වභාවය අනුව වර්ගීකරණය කර ඇත. ඒ අනුව බලය අයථා ලෙසපරිහරණයකිරීම/පක්ෂග්‍රාහී වීම/පොලීසිය විසින් ක්‍රියා නොකිරීම ලෙස වර්ගීකරණය වන

	කිරීමේ ප්‍රගතිය පිළිවෙලින් සියයට 24, 25 හා 17 ක අඩු ප්‍රතිශතයක පැවතුණි.		පැමිණිලිවල ස්වභාවය අනුව ප්‍රමුඛතාවය ලබාදී විමර්ශන කටයුතු අවසන් කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදීමට කටයුතු කරන බව.	අතර, පැමිණිලි අවසන් කිරීමේ ප්‍රගතිය පිළිවෙලින් සියයට34.99/31.56/37.28 කි.
(ඇ)	2023 දෙසැම්බර් 31 දින 2023 වන විට ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විභාග වෙමින් පවතින නඩු 216ක් පවතින අතර, ඊට අමතරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය යටතේ ක්‍රියාත්මක ගොනු 596ක් පැවති අතර, ඉන් 99ක් සඳහා පමණක් නිරීක්ෂණ ලබාදී තිබුණි.	විභාග වෙමින් පවතින නඩු සම්බන්ධයෙන් අවශ්‍ය නිරීක්ෂණ කඩිනමින් ලබාදීමට කටයුතු කළ යුතු ය.	එකී නඩු සම්බන්ධයෙන් අවසන් තීරණය ගරු ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අභියාචනාධිකරණය විසින් ලබාදිය යුතු වේ. නිරීක්ෂණ ලබා නොදුන් නඩු සම්බන්ධයෙන් කඩිනමින් නිරීක්ෂණ ලබාදීමට විශේෂ වැඩපිළිවෙලක් සකස්කර ක්‍රියාත්මක කරන බව.	2023දෙසැම්බර් 31 වන දිනට ක්‍රියාකාරී නඩු 216 ක් තිබුණු අතර, 2024 සැප්තැම්බර් 30 දින වන විට අවසන් වූ නඩු/තීන්දුව ලබාදුන් නඩු/ඉවත් කරන ලද නඩුගොනු ගණන 50 ක් වන අතර, ගොනු 166 ක් තවදුරටත් ක්‍රියාකාරී තත්ත්වයේ පවතී. පරිපාලන අභියාචනය විනිශ්චය අධිකාරිය විසින් අවසන් තීරණ ලබාදී අවසන් කරන ලද ගොනු සංඛ්‍යාව 73 කි. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත නිරීක්ෂණ යොමුකළ ගොනු සංඛ්‍යාව 479ක් වන අතර, නිරීක්ෂණ ලබාදීමට ඇති ගොනු සංඛ්‍යාව 381 කි. පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත

					නිරීක්ෂණ යොමුකළ පමණින් ගොනුව අවසන් නොවන බැවින් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය යටතේ ක්‍රියාත්මක මුළු ගොනු සංඛ්‍යාව 862 ක් වේ.
(ඇ)	2023 වර්ෂයේ ආරම්භ කළ විනය ගොනු 150න් 53ක තීරණ ලබාදී ඇති අතර, එහි ප්‍රගතිය සියයට 35 ක් පමණ විය. ඉන් සහකාර පොලිස් අධිකාරීවරුන් සම්බන්ධව ඉහළම විනය කටයුතු සම්බන්ධ පැමිණිලි 82ක් ලැබී ඇති අතර, ඉන් 23 ක් පැමිණිලි සඳහා තීරණ ලබාදීම මත ප්‍රගතිය සියයට 23 ක අඩු අගයක් ගෙන තිබුණි.	2023	විනය කටයුතු සම්බන්ධ පැමිණිලි කඩිනමින් විභාගකර තීරණ ලබාදිය යුතු ය.	විනය පරීක්ෂණ නිලධාරීන් පොලිස් නිලධාරීන්ගේ විමර්ශන කටයුතු භාරගැනීමට මැලිකමක් දැක්වීම මෙන්ම, ඒකී පරීක්ෂණ නිලධාරියෙකු විසින් විනය පරීක්ෂණ ගණනාවක් සිදු කිරීම නිසා පරීක්ෂණ නිලධාරීන් පත්කර ගැනීමට බොහෝ කාලයක් ගත වීම, වාර්තා ප්‍රමාද වීම ප්‍රගතිය අඩු වීමට හේතු වී ඇති බවත්, විනය පරීක්ෂණ ගොනුවල කාර්යයන් සම්පූර්ණයෙන් අවසන් නොවුව ද එම ගොනුවල කටයුතු සිදු කරමින් පවතින බව.	2023 වර්ෂයේදී ආරම්භ කළ ගොනු 150න් 53ක තීරණ විගණනයට පෙර ලබාදී තිබූ අතර, ඉතිරි ගොනු හා ලිපිවලින් 42ක කටයුතු 2024 සැප්තැම්බර් 30 දින වන විට අවසන්කර ඇත. සහකාර පොලිස් අධිකාරී ගොනු 82න් 23ක් විගණනයට පෙර අවසන්කර තිබූ අතර, 2024 සැප්තැම්බර් 30 දින වන විට ගොනු හා ලිපි 42ක වැඩ කටයුතු අවසන්කර ඇත.
(ඉ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව	2022 2023	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40	අභ්‍යන්තර විගණක තනතුර සඳහා නිලධාරියෙකු අනුයුක්ත කරන	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන

	කොමිෂම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබූ බැවින්, සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.		වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	ලෙස පත්වීම් බලධාරියාගෙන් අවස්ථා ගණනාවකදී ඉල්ලුම් කළත්, නිලධාරියෙකු ලබානොදීම හේතුවෙන් අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමට නොහැකි වී ඇති බව.	අමාත්‍යාංශ ලේකම් වෙතින් අවස්ථා ගණනාවකදී අභ්‍යන්තර විගණක නිලධාරියෙකු ලබාදෙන ලෙස ඉල්ලීම් සිදුකළ ද, මේ වන තෙක් එම තනතුර සඳහා නිලධාරියෙකු අනුයුක්ත කර නොමැත. එබැවින් අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමට නොහැකි විය.
(ඊ)	2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරවවාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කර නොතිබුණි.	2022	2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	විගණන වාර්තාව ද ඇතුළත් කර පෙර වර්ෂවලදී සිදුකළ ලෙසට වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර ඉදිරියේදී පාර්ලිමේන්තුවට සහ විගණනය වෙත ඉදිරිපත්කිරීමට කටයුතු කරනු ලබන බව.	2023 වර්ෂයේදී අදාළ ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තා කෙටුම්පත, මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කර ඇත.
(උ)	2023 වර්ෂයේදී වාහන 03 කට අනතුරු සිදුවී තිබුණ ද, මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව එම හානි සම්බන්ධයෙන් හානි පිළිබඳ ලේඛනයේ සටහන්කර නොතිබූ අතර, හානියේ වටිනාකම සහ එම හානිය රක්ෂණයෙන් ප්‍රතිපූරණය කිරීම පිළිබඳ තොරතුරු අනාවරණය නොවුණි.	2023	මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි සම්බන්ධයෙන් හානි පිළිබඳ ලේඛනයේ සටහන් කළ යුතු ය.	එක් අනතුරක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ සිදුකළ ද ප්‍රමාද දෝෂයකින් හානි පාඩු ලේඛනයේ ඇතුළත් කර නැති බවත්, අනෙකුත් අනතුරු 2 සම්බන්ධන් මු.රෙ.110 හා 104 ප්‍රකාරව කටයුතු	හානිපාඩු ලේඛනයේ ඇතුළත් කර නැති පරීක්ෂණය එම ලේඛනයේ ඇතුළත් කරන ලදී. අනෙක් අනතුරු 02 සම්බන්ධයෙන් 104 ප්‍රකාරව පරීක්ෂණ පවත්වා අවසන් කර ඇත.

කිරීමට සමීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති බවත්, එම වාර්තා ලද වහාම විගණනය වෙත ඉදිරිපත් කරන බවත්.